# බඹ ලොව කාලය

සිත් පිත් නැති අංශු ගැන කතාකිරීමට ප්‍රථමයෙන් විඥානයක් සහිත සත්ත්වයන් හා කාලය සම්බන්ධයෙන් කිවයුතු කරුණු කිහිපයක් වෙයි. සිංහල බෞද්ධයන්ට බටහිර භෞතික විද්‍යාවේ සාපේක්ෂතා ප්‍රවාදය සමග එකඟ නොවිය හැකි වැදගත් තැනක් වෙයි. අභිධර්ම විග්‍රහයට අනුව අරූපාවචර බ්‍රහ්ම ලෝක හතරක් වෙයි. ඉන් පළමුවැන්න ලෙස සඳහන්වන්නේ ආකාසානංචායතන ය. ඉන්පසු විඤ්ඤාණංචායතනය ද, ආකිංචඤ්ඤායතනය ද, නෙවසඤ්ඤා නා සඤ්ඤායතනය ද වෙයි. මේ බ්‍රහ්ම ලෝක හතර අරූපාවචර යන්නෙහි තේරුම එහි සත්ත්වයනට හෝ ඒ තත්ත්වයට පත්වී ඇති සත්ත්වයනට අපට දර්ශනයවන, නැත්නම් ඉන්ද්‍රිය ගෝචරවන වස්තු පමණක් නොව, සෘජුව දර්ශනය නොවන ක්වොන්ටම් අංශු ද නොමැති බව ය.

ආකාසානංචායතනයෙහි උපත ලැබූ සත්ත්වයකුට හෝ ඒ තත්ත්වය ලැබූ අයකුට ආකාශය පිළිබඳ හැඟීමක් වෙයි. ඉන් අදහස් කෙරෙන්නේ ඒ බඹ ලොවෙහි උපන් බ්‍රහ්මයනට තමා හැරෙන්නට වෙනත් දෙයක්, එනම් අවකාශයක් ගැන ද හැඟීමක් ඇති බව ය. ඉන්ද්‍රිය ගෝචරවන වස්තු හෝ සෘජුව ඉන්ද්‍රිය ගෝචර නොවන ක්වොන්ටම් අංශු හෝ දේව ආදී සත්ත්වයන් නොමැති ඒ බඹ තලයෙහි උපන් සත්ත්වයකුට අපරිමිත අවකාශයක් පිළිබඳ හැඟීමක් ඇතිවෙයි. එවැනි බඹ තලයක උපදින සත්ත්වයකුට යම් වස්තුවක් (කසිණයක්) අපරිමිතව ඇතැයි යන සිතිවිල්ල ඇතිකරගැනීමටත් ඉන්පසු ඒ කසිණය නොමැතියැයි ගෙන හුදු අවකාශය පමණක් අපරිමිතිව ඇතැයි යන සිතිවිල්ල ඇතිකරගැනීමටත් හැකිවෙයි. අරූපාවචර සිත්හි පළමුවැන්න වූ ආකාසානංචායතන සිතක (කුසල විපාක ආදී වශයෙන්) එලෙස අපරිමිත අවකාශයක් ඇතැයි යන සංකල්පය වෙයි.

මේ අපරිමිත අවකාශය නිව්ටෝනීයානු නිරපේක්ෂ අවකාශයෙන් වෙනස්වන බව අවධාරණය කළ යුත්තේ විශේෂයෙන්ම බටහිර විද්‍යාව බුදු දහම සමග සංසන්දනය කර බුදුදහමට එමගින් ඊනියා එළියක් සැපයීමට බලාපොරොත්තුවන ගිහි මෙන් ම පැවිදි පක්ෂයේ ද හිත සුව පිණිස ය. බුදු දහමට එළියක් සැපයීමට යැයි කියමින් බටහිර ක්‍රිස්තියානිය මත පදනම් වූ බටහිර විද්‍යාවේ ප්‍රවාද හා සංකල්ප ඉදිරිපත්කිරීම තරම් අගෞරවයක් බුදුන්වහන්සේට වෙනත් අයුරකින් කළ නො හැකි ය.

නිව්ටෝනියානු නිරපේක්ෂ අවකාශය නිරීක්ෂකයකු සිටියත් නැතත් පවතියි. ලෝකයේ (විශ්වයේ) වෙනත් කිසිවකු නොසිටියත් වෙනත් කිසිවක් නොතිබුණත් නිරපේක්ෂ අවකාශය වෙයි. එහෙත් ආකාසානංචායතන තලයෙහි අපරිමිත අවකාශය එසේ නිරීක්ෂකයකු නැතිව පවතින අවකාශයක් නො වෙයි. ඒ පවතින්නේ සත්ත්වයකුගේ (බඹකුගේ) සිතෙහි ය. එවැනි බ්‍රහ්මයකු නැත්නම් සිතක් ද නැත, අපරිමිත අවකාශයක් ද නැත. ආකාසානංචායතනයෙහි අවකාශය සාපේක්ෂ අවකාශයක් වෙයි. අයින්ස්ටයිනීය අවකාශය සාපේක්ෂ වුව ද සාපේක්ෂතා ප්‍රවාදයෙහි සාපේක්ෂ නොවූ නිරපේක්ෂ අවකාශ කාලයක් වෙයි.

විඤ්ඤාණංචායතනයෙහි උපදින බ්‍රහ්මයනට අවකාශය ගැන හැඟීමක්, සංකල්පයක් නැත. එහෙත් ඔවුනට විඤ්ඤාණයක් වෙයි. ආකිංචඤ්ඤායතනයෙහි උපදින බඹුන්ට කිසිවක් නැත යන සංකල්පය ඇතිවෙයි. නෙවසඤ්ඤා නා සඤ්ඤායතනයෙහි උපදින සත්ත්වයන්ට සඤ්ඤාවක් ඇත්තේ ද නැත, නැත්තේ ද යන සංකල්පය ඇතිවෙයි. අපට වැදගත්වන්නේ මේ බ්‍රහ්ම ලෝක හතරෙහි උපදින සත්ත්වයන්ගෙන් අවකාශය හා කාලය පිළිබඳ සංකල්ප ඇතිවන්නේ කිනම් ලෝකවල උපදින බඹුන්ට ද යන්න ය.

අප මේ ප්‍රශ්නයට පිළිතුරු දෙන්නේ අප ජීවත්වන කාමාවචර ලෝකයෙහි අත්දැකීම් මත පදනම්වෙමින් බව අමුතුවෙන් කිවයුතු නො වෙයි. භාවනාවෙන් යම් සමාධියක් උපදවාගත් අයකුට ඇතැම්විට මෙහි සඳහන් දෙයට වඩා වෙනත් අත්දැකීමක් තිබෙනු විය හැකි ය. කෙසේ වෙතත් මෙහි දී අදහස් ඉදිරිපත්කෙරෙන්නේ සාමාන්‍ය මනසක් ඇත්තකුගේ අත්දැකීම් මත පදනම් වෙමින් ය.

© Prof. Nalin De Silva

ආකාසානංචායතනයෙහි උපන් බ්‍රහ්මයකුට අවකාශය පිළිබඳ සංකල්පයක් තිබුණ ද අනෙක් බ්‍රහ්ම ලෝකවල උපදින බ්‍රහ්මයන්ට අවකාශය පිළිබඳ සංකල්පයක් නො වෙයි. එහෙත් ඔවුන්ගෙන් අඩුම තරමින් ආකිංචඤ්ඤායතනයෙහි උපදින බ්‍රහ්මයන්ට කාලය පිළිබඳ සංකල්පයක් වෙයි. ආකිංචඤ්ඤායතනයෙහි උපන් බඹුන්ට තමන් ගැන හැඟීමක් වන අතර තමන් වෙනස්වන්නේ ය යන හැඟීම ද වෙයි. ඔවුන්ට මතකයක් ද ඇතැයි සිතිය හැකි ය.

මෙයින් පැහැදිලිවන්නේ බුදු දහමට අනුව, අඩුම තරමින් ථෙරවාදී අභිධර්මය පිළිගන්නා සිංහල බුද්ධාගමට අනුව, අවකාශය නොමැතිව කාලය පැවතිය හැකි බව ය. මෙය අයින්ස්ටයිනීය සාපේක්ෂතා ප්‍රවාදයෙන් වෙනස්වීමක් වෙයි. අයින්ස්ටයිනීය සාපේක්ෂතා ප්‍රවාදයෙහි අවකාශයක් හෝ කාලයක් හෝ නොමැති නිරීක්ෂකයෙක් නො වෙයි. සිත් පිත් ඇති සැම නිරීක්ෂකයකුට ම අවකාශයක් හා කාලයක් වෙයි. එපමණක් නො වෙයි. සාපේක්ෂතා ප්‍රවාදයෙහි වුව ද ඒ ඒ නිරීක්ෂකයාට සාපේක්ෂව සිද්ධි දෙකක් අතර කාලය හා අවකාශය පිළිබඳ මිනුම් වෙනස් වුව ද, සියළුම නිරීක්ෂකයන් සම්බන්ධයෙන් ගත්කල සිද්ධි දෙකෙහි අවකාශ - කාලය නිරපේක්ෂ වෙයි. බටහිරයන්ට මේ නිරපේක්ෂකත්වයෙන් ගැලවිය නො හැකි ය. එය නිරපේක්ෂ වූ දෙවියන් වහන්සේගෙන් ගලා එයි.

එහෙත් සිංහල බෞද්ධයන් පටන්ගන්නේ ම සාපේක්ෂකත්වයෙන් ය. සියළු චිත්ත ඒ ඒ සත්ත්වයාගේ චිත්ත මිස විශේෂිත වූ දෙවියන් වහන්සේ කෙනකුගේ චිත්තවල ප්‍රක්ෂෙපණ නො වෙයි. සිංහල බෞද්ධයන්ගේ සාපේක්ෂ චිත්ත පිටුපස නිරපේක්ෂ වූ විශේෂිත චිත්තයක් නොමැත. චිත්ත නිරන්තරයෙන් වෙනස් වෙයි. සිංහල ථෙරවාද බුදු දහමෙහි මේ වෙනස්වන චිත්ත එකක් අනුයාත චිත්තයට ආදී වශයෙන් තොරතුරු යම් ප්‍රමාණයක් ලබා දෙයි. මේ තොරතුරු ලබාදීම නිසා එකතුවන යම් දත්ත රාශියක් වෙයි. අවසානයේ දී මතකයට ද මනසට ද හේතුවන්නේ මෙලෙස එක්රැස්කරගන්නා චිත්තය.

චිත්ත, චෛතසික ආදිය ඇතැම්විට ථෙරවාද බුදු දහමෙහි හඳුන්වනු ලබන්නේ පරමාර්ථ ධර්ම ලෙස ය. එහෙත් බෝධි භික්ෂුන්වහන්සේ අභිධම්මත්ථ සංගහයෙහි ඉංගිරිසි පරිවර්තනයට ලියා ඇති පෙරවදනෙහි දක්වා ඇති අන්දමට චිත්තයක් යනු මනසට (මනස යනු එවැනි චිත්ත එකතුවකින් නිර්මානය වන්නක් වෙයි.) ගතහැකි කුඩාම ධර්මතාව වෙයි. එලෙස මනසට ගතහැකි කුඩාම යන අර්ථයෙන් ඒවාට පරමාර්ථ ධර්ම යැයි කියැවෙයි. එසේ නැතිව මනසින් ස්වායත්ත වූ පරමාර්ථ ධර්මයක් ඉන් අදහස් නො කෙරෙයි.

ථෙරවාද බුදු දහමෙහි පරමාණු යනුවෙන් සංකල්පයක් වෙයි. මෙහි වැදගත් ම කරුණ නම් පරමාණු යන්න ද්‍රව්‍ය සම්බන්ධයෙන් පමණක් නොව කාලය යන්න සම්බන්ධයෙන් ද ගෙන ඇති බව ය. කාල පරමාණුව මනසට දැනෙන කුඩා ම කාල පරිච්ඡෙදය ලෙස සැලකිය හැකි ය. එසේ නොමැතිව මනසින් ස්වායත්ත ව පවතින ඉතා කුඩා කාලයක් ඉන් අදහස් නො කෙරෙයි. කාලය යන්න ම පඤ්ඤත්තියක් වූ කල, එනම් මනසෙහි නිර්මානයක් වූ කල, කාල පරමාණුවක් මනසින් තොරව පැවතිය හැකි නො වෙයි.

කාල පරමාණුව යන සංකල්පය භාරතයේ නොව අප රටේ සිංහල භික්ෂුන් වහන්සේලාගේ නිර්මානයක් බවට සාක්ෂි වෙයි. මේ සම්බන්ධයෙන් කැලණිය විශ්ව විද්‍යාලයේ පශ්චාත් පාලි හා බෞද්ධ ආයතනයෙහි හිටපු අධ්‍යක්ෂකවරයකු වූ මහාචාර්ය වයි කරුණාදාස මහතා පළකර ඇති අදහස් වැදගත් වෙයි. අද නොසිදුවුව ද, එක් කලෙක මෙරට විසූ බුද්ධිමතුන් අතින් සංකල්ප නිර්මානය වී ඇති බව අපි දනිමු. අපේ රටේ අදීන යුගයක දී එලෙස බුද්ධිමතුන් සංකල්ප හා ප්‍රවාද නිර්මානයෙහි යෙදුණ ද, විශේෂයෙන් ම බටහිර ක්‍රිස්තියානි යටත්විජිත යුගයෙන් පසුව මෙරට බිහිකෙරී ඇති උගතුන් දීන අනුකාරකයන් වීම කණගාටුවට කරුණකි. අප වහා වෙනස්කළ යුත්තේ මේ අනුකාරක බව ය.

කාල පරමාණුව, ද්‍රව්‍ය පරමාණුව, රූප ක්ෂණය, චිත්ත ක්ෂණය ආදිය සිංහල ථෙරවාද බුද්ධාගමෙහි ඇති සංකල්ප වෙයි. මේ සියල්ලෙන් ම කියැවෙන්නේ ඒ ඒ කාර්යයෙහි දී මනසට ග්‍රහණය කළහැකි කුඩාම කොටසක් වන බව ය. ද්‍රව්‍ය පරමාණුව යන්න බටහිර භෞතික විද්‍යාවෙහි යොදාගැණුන ද කාල පරමාණුව යන්න එහි තවමත් යොදා නො ගැනෙයි. මෙහි දී ද  අප අවධාරණය කළ යුත්ත නම් එකම වචනය යොදා ගැණුන ද පරමාණුව යන සංකල්පය බටහිරයන් විසින් හා අප විසින් යොදාගැනෙන්නේ අර්ථ දෙකකින් බව ය.

© Prof. Nalin De Silva

බටහිරයන් පරමාණුව යන්නෙන් අදහස්කරන්නේ අපෙන් තොරව පවතින යම් ද්‍රව්‍ය කොටසකට ය. ඔවුන්ට අනුව අප සිටියත් නැතත් පරමාණු වාස්තවික ව පවතියි. උදාහරණයක් ලෙස ගතහොත් හයිඩ්‍රජන් පරමාණු, අඩුම තරමින් එහි න්‍යෂ්ටි වූ ප්‍රෝටෝන මිනිසා නොව කිසිම ආකාරයක ජීවියකු නිර්මානය වීමට පෙර සිට, විශ්වයෙහි ආරම්භයෙහි සිට, පැවතී ඇත. එහෙත් සිංහල බෞද්ධයන්ගේ පරමාණුව යන්න මනසට සාපේක්ෂ වූ සංකල්පයකි. අපේ සංස්කෘතියෙහි මිනිස් මනසකින් තොරව කාල පරමාණු හෝ වෙනත් පරමාණු ගැන කතාකිරීම නිෂ්ඵල ක්‍රියාවක් වෙයි.

බටහිර භෞතික විද්‍යාවෙහි සඳහන් පරමාණු ගැන අප ද දැන සිටියේ යැයි කියන පඬිවරුන් මේ බව සැලකිල්ලට ගත යුතු ය. අපේ පරමාණු යනු මනසට ගතහැකි කුඩාම කොටස් බව ද බටහිරයන්ගේ පරමාණු යනු වාස්තවික ව පවත්නා දේ බව ද අප අමතක නොකළ යුතු ය. අපේ දැනුම බටහිර දැනුම සමග සංසන්දනයකරන උගතුන් මේ වෙනස ගැන සැලකිලිමත් නොවන්නේ ද ඔවුන්ගේ පරාධීන මනස හෙළිදරවුකරමින් ය.

අවකාශය යන සංකල්පය නොමැති විට වුවත්, කාලය යන සංකල්පය සත්ත්වයනට තිබිය හැකි බව ථෙරවාද අභිධර්මයෙන් අපට ගතහැකි පාඩම වෙයි. මෙය බටහිර භෞතික විද්‍යාවට පටහැණි බව බුදු දහම බටහිර විද්‍යාව සමග සංසන්දනයකිරීමට වලිකන්නෝ නො දනිති. අයින්ස්ටයිනීය සාපේක්ෂතා ප්‍රවාදයට පටහැණි සංකල්ප සිංහල බෞද්ධ සංස්කෘතියෙහි ඇති බව පෙන්වාදීමට අප මැළිවිය යුතු නො වෙයි. අපට අපේ භෞතික විද්‍යාවක් ගොඩනගා ගැනීමෙහි දී මෙවැනි සංකල්ප උපකාරී වනු ඇත. අයින්ස්ටයිනීය සාපේක්ෂතා ප්‍රවාදය අවසාන විග්‍රහයෙහි දී නිරපේක්ෂ වෙයි. සිංහල බෞද්ධයෝ උපන්ගෙහි සාපේක්ෂතාවාදී වෙති.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva